මාධ්‍ය තුළ ඇතැම් විටකදී යම් යම් නීතිවිරෝධී සිදුවීම් සම්බන්ධයෙන් වාර්තා කරනා විට, එම නීතිවිරෝධී සිදුවීම් වලට කාන්තාවන් සම්බන්ධ වේ නම්, එය හුවා දැක්වීම සිදු කරනා බව අප මින් පෙරද විටින් විට පෙන්වා දී ඇත්තෙමු. විශේෂයෙන්ම කාන්තාවන් සහ පිරිමින් යන දෙපාර්ශවයම විසින් නීතිවිරෝධී කටයුත්තක් සිදුකරනු ලැබූ අවස්ථාවකදී පවා, පිරිමින් කළ වරදට වඩා කාන්තාව කළ එම සමාන වරදට වැඩි බරක් යොදා පෙන්වීම සිදුවේ. මෙය සැබවින්ම ස්ත්‍රී පුරුෂ භාවය පදනම් කරගනිමින් මාධ්‍ය මගින් කෙරෙනා කොන් කිරීමකි. එය ඍජුව මෙන්ම වක්‍රාකාරයෙන්ද සිදුවිය හැක.

මීට උදාහරණ ලෙසින් දිවයින පුවත්පතේ (12/10) "දික්වැල්ලේ ගෙයක් අස්සේ ගෑනුත් බූරු ගහලා" යන සිරස්තලයෙන් යුතුව දැක්වෙන පුවත ගත හැක. එසේම "පිරිමි දෙදෙනෙක් පැනලා ගිහින්, 9 දෙනෙක් අත්අඩංගුවට" යනුවෙන් උප සිරස්තලයක්ද වේ. කෙසේ නමුත් මෙහි පුවත් අන්තර්ගතය තුළ කාන්තාවන් අට දෙනෙකු සහ එක් පිරිමි පුද්ගලයෙකු අත්අඩංගුවට ගත් බව සඳහන් වේ.

අප මුලින්ම සඳහන් කර ඇති ආකාරයට, මෙහි සිරස්තලය ඔස්සේ කාන්තාවන්ව ස්ත්‍රී පුරුෂ භාවය පදනම් කරගනිමින් කොන් කිරීමක් සිදු නොවන්නේද? එසේ නම් එය මාධ්‍ය ආචාර ධර්මයන්ට පටහැණි වාර්තාකරණයක් නොවන්නේද?

**#MediaEthicsSL #lka #SinhalaPress #Divaina**